# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1692/26 – 2011 පෙබරවාරි 10 වැනි බ්‍රහස්පතින්දා – 2011.02.10

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: T7/37/2004.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත් වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2004.07.27 වන දින අංක 1351/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2004.07.20 දින දරන නියෝගයෙන්,

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් එයාර්ක්‍රාෆ්ට් ටෙක්නීෂියන්ස් ඇසෝසියේෂන්, අංක. 14, මහවෙල පෙදෙස, කිරුළපන, කොළඹ 05

සහ

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, 19-22, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, ඇචිලන් චතුරශ්‍රය, කොළඹ 01.

අතර පවත්නා 2004.07.16 දින දරන කාර්මික ආරාවුල පිළිබඳව කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කම්කරු විනිශ්චය සභා අංක 08 හි සභාපති අතිරේක විනිසුරු පාලිත වීරසේකර මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම එම නියෝගය අවලංගු කරන අතර, එකී 2004.07.20 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 පෙබරවාරි මස 02 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: T7/37/2004.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් එයාර්ක්‍රාෆ්ට් ටෙක්නීෂියන්ස් ඇසෝසියේෂන්, අංක. 14, මහවෙල පෙදෙස, කිරුලපන, කොළඹ 05

සහ

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, 19-22, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, ඇචිලන් චතුරශ්‍රය, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් වත්තල, හැඳල, විමල මරියා මාවත, හි අංක 33/2 හි, පාලිත වීරසේකර මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2011 පෙබරවාරි මස 02 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: T7/37/2004.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් එයාර්ක්‍රාෆ්ට් ටෙක්නීෂියන්ස් ඇසෝසියේෂන්, අංක. 14, මහවෙල පෙදෙස, කිරුලපන, කොළඹ 05

සහ

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, 19-22, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, ඇචිලන් චතුරශ්‍රය, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ,

ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, විසින් මෙහි පහත නම් සඳහන් සේවකයින් දහතුන් දෙනාගේ සේවය අවසන් කිරීම යුක්තිසහගතද යන්න හා නොඑසේනම් ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්න පිළිබඳව වේ.

01. ටී. එම්. ඊ. කාසිම් මහතා
02. එම්. ජී. ඒ. ඩී. චන්ද්‍රපාල මහතා
03. ජී. ඒ. ඩී. එස්. පෙරේරා මහතා
04. යූ. එල්. එම්. පෙරේරා මහතා
05. බී. පී. එන්. ද සිල්වා මහතා
06. එම්. වී. එස්. කුරේ මහතා
07. ඕ. එම්. ඒ. ඒ. පෙරේරා මහතා
08. ජී. ජී. සරත්චන්ද්‍ර මහතා
09. එන්. එම්. වී. කේ. රණසිංහ මහතා
10. වී. වික්‍රමසිංහ මහතා
11. ජේ. ඒ. අනුර මහතා
12. එස්. එස්. පී. එච්. මාහිංගොඩ මහතා
13. කේ. එන්. සී. පෙරේරා මහතා

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2011 පෙබරවාරි මස 02 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

02 - 655

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.